පීඨාධිපති කාර්යාලය
OFFICE OF THE DEAN
මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
FACULTY OF HUMANITIES AND SOCIAL SCIENCES
UNIVERSITY OF SRI JAYEWARDENEPURA

2024.01.17

# විශේෂ නිවේදනය

**2022/23 අධ්‍යයන වර්ෂයට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය සඳහා සුදුසුකම් ලබා ඇති සියලු ස්වාමීන් වහන්සේලා/ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙත,**

මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ නවක ශිෂ්‍ය ශිෂ්‍යාවන් ලියාපදිංචි කිරීමේ කටයුතු ඉදිරි සතිය තුලදී සිදුකිරීමට නියමිතය. ඒ සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට ඔබ ලබාදී ඇති විද්‍යුත් තැපැල් ලිපිනයට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් විද්‍යුත් තැපැල් පණිවිඩයක් (E-mail) එවනු ඇත. ඒ පිළිබඳ විමසිලිමත්ව සිටින ලෙස දන්වනු කැමැත්තෙමි. ලියාපදිංචි කිරීමේ කටයුතු සිදුකරනු ලබන්නේ අන්තර්ජාලය මඟින් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ වන බවද දන්වමි.

විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි වීම සඳහා පහත සඳහන් ලිපිලේඛන සූදානම් කර තබා ගැනීම ඔබගේ පහසුව සඳහා හේතු වනු ඇත.

**ලියාපදිංචි වීමේ කටයුතු සඳහා,**

1. පාස්පෝට් ප්‍රමාණයේ (45mm උස x 35mm පළල) සුදු පසුබිමෙහි වර්ණ උඩුකය ඡායාරූපයක මෘදු පිටපතක් (මාස 06ක් ඇතුලත ඡායාරූප ශාලාවකින් ලබාගත්) **.jpg** ආකෘතියෙන් උඩුගත කිරීමට සූදානම් කර තබා ගන්න.(මේ සඳහා පරිලෝකනය (Scan) කරන ලද, උඩුකය අපැහැදිලි, සිනහවෙමින් හෝ ඇස් පියවී ඇති, උපැස් යුවල සහිත, ප්‍රමිතියෙන් තොර වර්ණ සහිත, නළල සහ හිස වැසෙන සේ ඇති වැසුම් සහිත හෝ වෙනත් අනුමත නොකරන මෙන්ම **.jpg** ආකෘතියෙන් තොර ඡායාරූප ඇතුලත් නොකළ යුතුය) (උපරිම ධාරිතාව - 2MB)

2. ඔබගේ උප්පැන්න සහතිකය (ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ නමක් නම් පැවිදි සහතිකය) සහ ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපත් සාමදාන විනිශ්චයකාරවරයෙකු විසින් සහතික කර, වෙන් වෙන් වශයෙන් පැහැදිලි pdf ආකෘතියේ වර්ණ පරිලෝකන පිටපත් (Scanned Copies) ලෙස උඩුගත කිරීමට සූදානම් කර තබා ගන්න. (අපැහැදිලි පරිලෝකන පිටපත්, ජංගම දුරකථන හෝ වෙනත් උපකරණ භාවිතයෙන් ලබාගත් ඡායාරූප ඇතුලත් නොකල යුතුය).

3. උප්පැන්න සහතිකය දෙමළ භාෂාවෙන් ඇත්නම් එහි ඉංග්‍රීසි පරිවර්තනයක පිටපතක් ඉහත පරිදි pdf ආකෘතියට අනුව උඩුගත කිරීමට සූදානම් කර තබා ගන්න. (උපරිම ධාරිතාව - 2MB)

**ශිෂ්‍ය හැඳුනුම්පත සකස් කිරීම සඳහා,**

4. මීට අමතරව විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය හැඳුනුම්පත මහජන බැංකුවේ ATM කාඩ්පත සමඟ සම්බන්ධ කර ලබාදෙන බැවින් ඒ සඳහා මහජන බැංකුවේ <u>ප්‍රධාන ශාඛාවක*</u> පහත සඳහන් ලක්ෂණ වලින් යුත් ගිණුමක් විවෘත කිරීම අනිවාර්යයෙන් සිදු කල යුතුවේ.

i. මහජන බැංකු ප්‍රධාන ශාඛාවක් වෙත පිවිස Electronic Banking පද්ධතිය තුළ පමණක් ගිණුම විවෘත කල යුතුය.
ii. **SA-YES Uni** ඉතුරුම් නිමැවුම යටතේ පමණක් නව ගිණුම විවෘත කල යුතුය.
iii. ගිණුමේ ආරම්භක තැන්පතුව රු.1000/-ක් විය යුතුය.

නුගේගොඩ, ශ්‍රී ලංකාව Nugegoda, Sri Lanka T.P: 011-2758312, 011-2758313 E-mail : dofhss@sjp.ac.lk FAX : 011-2803196
www.fhss.sjp.ac.lk

***-** දිවයින පුරා පිහිටි මහජන බැංකු ප්‍රධාන ශාඛාවන් පිළිබඳ තොරතුරු මහජන බැංකු වෙබ් අඩවියට පිවිස එහි ඇති Quick Link යටතේ සඳහන් Branch Network වෙත යොමු වීම මඟින් ශාඛා පිළිබඳව ලබාගත හැක.

මාර්ගගත ක්‍රමයට අයදුම් පිරවීමේදී ඇතුළත් කල යුතු ගිණුම් අංකය ලෙස මෙම නව ගිණුම් අංකය සඳහන් කිරීමට පියවර ගත යුතු අතර එය SA-YES Uni ඉතුරුම් නිමැවුම් යටතේ Electronic Banking පද්ධතියේ පමණක් විවෘත කල විශේෂිත ගිණුමක් විය යුතුය.

**නේවාසිකාගාර පහසුකම්,**

පවතින සීමිත ඉඩකඩ මත තෝරාගත් පිරිසකට පමණක් නේවාසිකාගාර පහසුකම් ලබාදෙන අතර එහිදී පහත සඳහන් මූලික නිර්ණායක සැලකිල්ලට ගනු ලැබේ.

- විවාහක සිසුන් සඳහා,
- පදිංචිය කිලෝමීටර 25 ට අඩු දුර සහිත සිසුන් සඳහා,

නේවාසිකාගාර පහසුකම් ලබාදෙනු නොලැබේ.

නේවාසිකාගාර පහසුකම් ලබාදීමේදී පවුලේ ආදායම් තත්ත්වයද සැලකිල්ලට ගනු ලැබේ.

නේවාසිකාගාර පහසුකම් ලබාදීම 2024 ජනවාරි 22 දින උදෑසන 8.00 සිට දහවල් 12.00 දක්වා සිදු කරන අතර ඊට පෙර ඒ සඳහා විශ්වවිද්‍යාලයට පැමිණීමෙන් වළකින ලෙස දන්වමි.

**නම්නීකරණ වැඩසටහන,**

පීඨයේ නම්නීකරණ වැඩසටහනෙහි පළමු අදියර මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ජනවාරි 19වන දින සිට සිදුකිරීමට නියමිත වන අතර දෙවන අදියර 22වන දින සිට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේදී භෞතිකව පැවැත්වීමට නියමිතය.

2024 ජනවාරි 22 දින සවස 1.00 සිට මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයට ලියාපදිංචි වී ඇති සිසුන් සඳහා වන සමාරම්භක රැස්වීම පැවැත්වෙන අතර එදිනට සියළුම ශිෂ්‍යයින්ගේ පැමිණීම අපේක්ෂා කරමි. මෙදින රැස්වීම පැවැත්වෙන ස්ථානයේ පවතින ඉඩකඩ පහසුකම් සීමිත වන බැවින් ශිෂ්‍යයින් පමණක් රැස්වීම් ශාලාවට ඇතුල් වීම අපේක්ෂා කෙරේ. එදින සිට සතියක් පුරාවට මෙම නම්නීකරණ වැඩසටහන පැවැත්වීමට නියමිතය.

නම්නීකරණ වැඩසටහනෙහි සිව්වන දින පැවැත්වෙන වැඩසටහන් අතර ක්‍රීඩා සම්බන්ධ වැඩසටහන්ද සංවිධානය කර ඇති බැවින් ඒ සඳහා සුදුසු ඇඳුමක් රැගෙන එන ලෙසද දන්වා සිටිමි.

මහාචාර්ය ශිරාන්ත හීංකෙන්ද
පීඨාධිපති
මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය